# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2213/40 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2017(III).

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

31 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක වන මේ නියමය මගින්, එකී පනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වන බවට නිශ්චය කරනු ලැබේ.

2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන *අති විශේෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ සාදන ලද නියමය, එය යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

1A - G 33648 — 60 (2021/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

1. පෙරාතුව වූ මාස දොළහ (12) තුළ, සමස්තය දින එකසිය අසූ තුනක් (183) හෝ ඊට වැඩි කාල සීමාවක් ශ්‍රී ලංකාව තුළ සිටියාවූ යම් ශ්‍රී ලාංකික පුරවැසියකු හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු හා විවාහ වී සිටින විදේශ රටක යම් පුරවැසියකු.

2. (අ) පෙරාතුව වූ මාස දොළහ (12) තුළ, සමස්තය දින එකසිය අසූ දෙකකට (182) නොවැඩි වූ කාලසීමාවක්, නිවාඩුවක් සඳහා, අධ්‍යාපනය සඳහා, ව්‍යාපාර සඳහා, වෛද්‍ය ප්‍රතිකාර සඳහා හෝ ඒ හා සමාන වෙනත් යම් හේතුවක් මත තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරට නික්ම ගොස් ඇති;

(ආ) වෙනත් රටක් මගින් ප්‍රදානය කළ ශිෂ්‍ය වීසා බලපත්‍රයක් හෝ ඒ හා සමාන වීසා බලපත්‍රයක් මත සහ එම අධ්‍යයන කටයුතු අවසන් වීමෙන් පසු දින එකසිය අසූ දෙකකට (182) නොවැඩි වැඩිදුර කාල සීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති,

යම් ශ්‍රී ලාංකික පුරවැසියකු.

3. රාජ්‍ය සංස්ථා, රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය නියෝජ්‍යායතන සහ රාජ්‍ය හිමිකම සහිත වෙනත් යම් අස්ථිත්ව ද ඇතුළත්ව ශ්‍රී ලංකා රජය.

4. (අ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික (නම් කරනු ලැබ ඇති නාමය හෝ පදවි නාමය කුමක් වුව ද එම නාමයෙන් හෝ පදවි නාමයෙන්) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන්, කොන්සල්වරුන් හෝ වෙළඳ කොමසාරිස්වරුන්;

(ආ) වීසා ප්‍රදානය කිරීමේ බලධරයා විසින් වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති ඉහත 4 වන ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් යම් තැනැත්තකුගේ කාර්ය මණ්ඩල සාමාජිකයකු වන්නා වූ ශ්‍රී ලාංකික පුරවැසියකු වන යම් තැනැත්තකු;

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර දී බඳවා ගනු ලැබූ තැනැත්තන් හැර, ශ්‍රී ලංකාවෙන් බැහැර සේවය කරනු ලබන, රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, බලපත්‍රලාභී බැංකුවක හෝ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක කාර්ය මණ්ඩල සාමාජිකයකු;

(ඈ) ඉහත (4) වන ඡේදයේ (අ), (ආ) හෝ (ඇ) වන අනු ඡේද යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු ලෙස නිශ්චය කරනු ලැබූ යම් තැනැත්තකුගේ පවුලේ යම් සාමාජිකයකු.

5. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අදාළ වීසා බලපත්‍රය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික හෝ සේවා නියුක්තියේ යෙදී සිටින, එහෙත් වෙනත් රටවලට යන අතර මග සිටින මගීන් හෝ විනෝද හෝ ව්‍යාපාර කටයුතු සඳහා රටේ සංචාරය කරනු ලබන සංචාරකයන් නොවන, විදේශ රටවල පුර වැසියන්.

6. හිමිකාරත්වය දරනු ලබන, පාලනය කරනු ලබන හෝ කළමනාකරණය කරනු ලබන තැනැත්තන්ගේ පුරවැසිභාවයේ තත්ත්වය නොසලකා, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පහත සඳහන් ආයතන:-

(අ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගම්;

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථා ගත කරනු ලැබූ බලපත්‍රලාභී බැංකුවල (විදේශ බැංකු) ශාඛා ඇතුළු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විදේශ සමාගම්;

(ඇ) අක්වෙරළ සමාගම් ලෙස ලියාපදිංචි කරනු ලැබූ සමාගම්;

(ඈ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරනු ලැබූ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සමාජ, සමිති හෝ වෙනත් යම් සංවිධාන.

7. මිය යෑම සිදුවූ අවස්ථාවේ දී, මියගිය තැනැත්තා හෝ ගිවිසුම ඇතිකර ගත් අවස්ථාවේ දී ගිවිසුම්කරු ඉහත 1 සිට 5 දක්වා වන ඡේද ප්‍රකාර නේවාසිකයකු වූ අවස්ථාවක දී, හුදෙක්ම අදාළ තත්ත්වයෙහි කටයුතු කරනු ලබනවිට දී, අන්තිම කැමති පත්‍ර භාර හෝ ජීවත් වන්නන් අතර වන ගිවිසුම්වල වෙනත් රටක භාරකරුවන් සහ බූදලයන්හි අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ අන්තිම කැමති පත්‍රයන්හි පොල්මඃකරුවන්.

8. 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ නැවක සේවයේ නියුක්ත කාල සීමාව තුළ දී, එසේ සේවයේ නියුක්තව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්.

9. ඉහත 1 වන, 2 වන, 4 වන හෝ 7 වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සපුරා නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් වන හෝ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති තැනැත්තන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝග, නියම සහ විධානවලට යටත්ව, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමේ කාර්යය සඳහා පමණක්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

02 - 392

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.